ප. රි. ච්. ඡේ. ද. ය

01

# බදුකරණය හැඳින්වීම

**පරිච්ඡේදයේ හැඳින්වීම**

මෙම පාඩම මගින්;

බදුකරණයේ මූලධර්ම සහ සෘජු සහ වක්‍ර බදු පැහැදිලි කිරීම

ශ්‍රී ලංකාවේ බදු අධිකාරීන් හඳුනා ගැනීම

ශ්‍රී ලංකාවේ බදුකරණ නීතිමය රාමුවේ කොටස් හඳුනා ගැනීම

ආදායම් බද්ද පැනවීම පැහැදිලි කිරීම

ශ්‍රී ලංකාවේ ආදායම් බදු අය කිරීමේ වාසික තැනැත්තන් සහ නිර්වාසික තැනැත්තන් අතර වෙනස සහ බදු ගණනයේදී නේවාසික බව හඳුනා ගැනීම.

විෂය නිර්දේශයේ බර තැබීම 5% කි.

# අධ්‍යයන ප්‍රතිඵලය

| සෑම මාතෘකාවක්ම අවසානයේ දී ඔබට පහත දෑ පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත.; |
| --- |
| බදුකරණයට අදාළ මූලධර්ම අවබෝධය |
| සෘජු සහ වක්‍ර බදු හඳුනාගැනීම |
| ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බදු අධිකාරීන් හඳුනාගැනීම |
| ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විවිධ බදු වර්ග වල නෛතික රාමුව (පනත්, ගැසට් නිවේදන, නඩු තීන්දු නීතිය) සහ නිකුත් කර ඇති අදාළ පාලන විධානයන් සහ බදු අධිකාරීන් විසින් පලකරන ලද පුවත්පත් දැන්වීම් හඳුනා ගැනීම. |
| ආදායම් බද්ද පැනවීම පිළිබඳ අවබෝධය |
| බදුකරණයට අදාළ නේවාසික නීතිය භාවිතය |

# 1. බදුකරණය හැඳින්වීම

රටක ආර්ථික කටයුතු සදහා රජයක් දායක විමේදී, ප්‍රාග්ධන වියදම් සහ අයභාර වියදම් දැරීම අනිවාර්ය වේ. එවැනි මුල්‍ය වියදම් දැරීම සදහා රජයක් එවැනි වියදම් ආවණය කර ගැනිම සදහා ආදායම් උපයාග න්නා ප්‍රධාන මාර්ගය වන්නේ බදු පැනවීමෙන් ලබා ගන්නා බදු ආදායමයි. එම  නිසා රාජ්‍ය වියදම් දැරීම සදහා අරමුදල් රැස්කිරීමේ කාර්යයන් බදුකරණයේ ප්‍රාථමික කාර්යය ලෙස හදුනාගත හැකිය. එය **බදුකරණයේ ප්‍රධාන කාර්යයන්** පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම වඩා වැදගත් වේ.

## බදුකරණයේ ප්‍රාථමික කාර්යයන්

බදුකරණයේ කාර්යයන්, ප්‍රාථමික කාර්යයන්, අර්ථික කාර්යයන් සහ සමාජයීය කාර්යයන් ලෙස ප්‍රධාන කොටස් වලට බෙදා දැක්විය හැකිය.

රාජ්‍ය වියදම් දැරීම සදහා අරමුදල් රැස්කිරීම බදුකරණයේ ප්‍රාථමික කාර්යය වේ.

### රාජ්‍ය වියදම්

රජය විසින් මුදලින් අයකිරීමකින් තොරව හෝ සහන ගාස්තුවක් යටතේ රටේ පුරවැසියන් සදහා විවිධ වු සේවාවන් සපයනු ලබයි.

### රජය මගින් සපයන සේවා සඳහා උදාහරණ

- පොලිසිය සහ හමුදාව විසින් සපයන ආරක්ෂාව, නීතිය සහ නියෝග
- රජයේ පාසල් සහ විශ්වවිද්‍යාල විසින් සපයනු ලබන නිදහස් අධ්‍යාපනය
- රජයේ ආරෝග්‍යශාලා විසින් සපයනු ලබන නිදහස් වෛද්‍ය සේවාවන්
- මාර්ග පද්ධති නඩත්තු කිරීම
- විදුලිය සහ ජලය සහනදායී මිලට සැපයීම

### බදුකරණයේ ආර්ථික කාර්යයන්

- දේශීය හෝ විදේශීය ආයෝජන යොමු කළ යුතු දිශාවන් සැකසීම

  රජයකට, වරිපනම් සහ දිරි දීමනා වැනි බදු මෙවලම් යොදාගනිමින් පෞද්ගලික අංශයේ යම් යම් ආයෝජනයන් කෙරෙහි දිරිගැන්වීම හෝ අධෛර්ය කිරීම කළ හැක.
- විදේශීය තරඟකරුවන්ගෙන් දේශීය කර්මාන්තයන් ආරක්ෂා කර ගැනීම.

  අත්‍යවශ්‍ය දේශීය කර්මාන්තයන් විදේශීය තරඟකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීම පිණිස ආනයන බදු පැනවීම වැනි විවිධ බදු මෙවලම් උපකාරී කර ගත හැක.

**බදුකරණයේ සමාජයීය කාර්යයන්**

- සමාජය විසින් අනුමත නොකරන කාර්යයන් අධෛර්යමත් කිරීම -

  මත්පැන් සහ දුම්වැටි පරිහරණය කිරීම, සූදු සහ ඔට්ටු ඇල්ලීම වැනි අනුමත කළ නොහැකි කාර්යයන් සීමා කිරීමේ මෙවලම් ලෙස බදු උපකාරී කරගත හැක.
- සමාජය විසින් අනුමත කරනු ලබන කාර්යයන් දිරිගැන්වීම -

  ඉතිරි කිරීම්, විශ්‍රාමික ආයෝජන, නව සොයාගැනීම්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වැනි සමාජයක් විසින් අනුමත කරනු ලබන කටයුතු දිරිගැන්වීමට බදු ක්‍රමය උපයෝගී කර ගත හැක.
- ආදායම් පරතරය අඩුකිරීම -

  සමාජයේ ඇති ආදායම් අසමතුලිතතාවය අඩු කිරීම සඳහා බදු සහනයක් ලබාදීම සහ වර්ධන (ක්‍රමානුකූලව ඉහළ යන) බදු ප්‍රතිශතයන් යොදාගනීම වැනි දෑ කළ හැකිය.

බදුකරණය පිළිබඳ ඉගෙනීමේදී බදුකරණයේ මූලධර්ම, බදු වර්ගීකරණයන්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බදු අධිකාරීන්, බදුකරණයේ නීතිමය රාමුව, ආදායම් බද්ද පැනවීම සහ වාසික නිර්වාසිකභාවය යන ආදිය අවබෝධ කරගැනීම වඩා වැදගත් වේ.

## 1.1 බදුකරණයේ මූලධර්ම

රටක බදුකරණය සාමාන්‍යයෙන් පදනම් වන්නේ බදු මූලධර්ම මතය.

### 1.1.1 සාධාරණත්වය (Equity)

හොඳ බදු පද්ධතියක් ගෙවීමේ හැකියාව මත පදනම් විය යුතුය. එනම් සියලුම ජනතාව තම තමාගේ දැරීමේ හැකියාව අනුව රාජ්‍ය වැය සඳහා උරදීම කළ යුතුවේ. පොහොසත් අය වැඩියෙනුත්, දුප්පත් අය අඩුවෙනුත් බදු බර දැරිය යුතුවේ.

### 1.1.2 වර්ධක බව (Progressivity)

මෙය තිරස් සාධාරණත්වය මූලධර්මය සහ ගෙවීමේ හැකියාව අනුව බදු අයකිරීමේ පදනම මත ගොඩනැගේ. වැඩි ආදායම් ලාභීන් වැඩි බදු මුදලකුත් අඩු ආදායම් ලාභීන් අඩු බදු මුදලකුත් ගෙවීම සිදුවේ.

### 1.1.3 රැස්කිරීමේ පිරිවැය අවම වීම (Economy)

බදු අයකරගැනීමට දරනු ලබන පිරිවැය අවම කරගත යුතු අතර එමගින් උපරිම ආදායමක් රජයට ලැබිය යුතුවේ.

### 1.1.4 නිශ්චිත බව (certainty)

ඒ ඒ තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල, ගෙවිය යුතු දිනය, ගෙවිය යුතු ක්‍රමය සහ ගණනය කිරීමේ පදනම හා ක්‍රමය ආදිය ඉතාමත් පැහැදිලි සහ නිශ්චිත විය යුතුය.

### 1.1.5 ප්‍රමාණවත් බව (Adequacy)

එකතුකර ගන්නා බදු මුදල අපේක්ෂිත රාජ්‍ය වියදම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් විය යුතුය.

### 1.1.6 සරල වීම (simplicity)

බදු ක්‍රමය ඉතා සරළ, පහසු සහ පහසුවෙන් තේරුම්ගත හැකි තත්ත්වයක තිබිය යුතුවේ.

### 1.1.7 පුළුල් පරාසයක් වීම (Broad based)

තනි තනි පුද්ගලයන්ගේ බදු බර අවම කර ගැනීම සඳහා සමාජයේ විවිධ කොටස් සහ ජන කොටස් ආවරණය වන ලෙසින් වූ පුළුල් බදු ක්‍රමයක් පැවතිය යුතුය.

### 1.1.8 ස්ථාවරත්වය (stability)

බදු අයකිරීමේ ව්‍යුහය නිතර නිතර වෙනස් නොකළ යුතුය.

### 1.1.9 පහසුබව සහ ස්වේච්ඡා අනුකූලතාව (Convenience and voluntary compliance)

පනවනු ලබන බදු, ගෙවන්නාට පහසුවෙන් ගෙවීමට හැකිවිය යුතු අතර, තම කැමැත්තෙන්ම අවනත වීමට උනන්දු කළ යුතුය.

## Q ප්‍රශ්නය

1. බදුකරණයේ මුලධර්ම ලැයිස්තුගත කරන්න.

## A පිළිතුර

| | |
|---|---|
| සාධාරණත්වය | වර්ධක බව |
| රැස්කිරීමේ පිරිවැය අවම වීම | නිශ්චිත බව |
| ප්‍රමාණවත්බව | සරල බව |
| පුළුල් බව | පුළුල් පරාසයක් වීම |
| ස්ථාවරත්වය | පහසුබව සහ ස්වේච්ඡා අනුකූලතාවය |

## 2. ඍජු සහ වක්‍ර බදු

### 2.1 ඍජු සහ වක්‍ර බදු

බදු, ඍජු සහ වක්‍ර බදු ලෙසින් පුළුල්ව වර්ගීකරණය කළ හැක.

#### 2.1.1 ඍජු බදු

ඍජු බදු ලෙසින් හඳුන්වන සියලු බදු, බදු ගෙවන්නා විසින් ඔහු උපයාගත් ආදායම් මත ගෙවීම සිදුවේ. මේ අනුව බදු ගෙවන්නා විසින්ම එම බදුවල පිරිවැය දරා ගැනීම සිදුවේ. ආදායම් බද්ද ඍජු බදු සඳහා උදාහරණයකි.

#### 2.1.2 වක්‍ර බදු

වක්‍ර බදු, එහි පිරිවැය දරන්නා විසින් නොවන වෙනත් කෙනෙකු විසින් එකතුකර ගෙවනු ලැබේ. එකතු කළ අගය මත බද්ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධානතම වක්‍ර බද්ද වේ.

## Q ප්‍රශ්නය

2. පහත දී ඇති බදු සෘජු සහ වක්‍ර ලෙස වර්ගීකරණය කර දක්වන්න.

ආදායම් බද්ද

එකතුකළ අගය මත බද්ද

ආර්ථික සේවා ගාස්තුව

මුද්දර බද්ද

ණය ආපසු ගෙවීමේ අය බද්ද

ඔට්ටු ඇල්ලීමේ බද්ද

ලොතරැයි බද්ද

## A පිළිතුර

| බදු වර්ගය | සෘජු | වක්‍ර |
|---|---|---|
| ආදායම් බද්ද | ✓ | |
| එකතු කළ අගය මත බද්ද | | ✓ |
| ආර්ථික සේවා ගාස්තුව | ✓ | |
| මුද්දර බද්ද | ✓ | |
| ණය ආපසු ගෙවීමේ අය බද්ද | ✓ | |
| ඔට්ටු ඇල්ලීමේ බද්ද | ✓ | |
| ලොතරැයි බද්ද | ✓ | |

## 3. ශ්‍රී ලංකාවේ බදු අධිකාරීන්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් ආදායම් දෙපාර්තමේන්තු, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව යනාදිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු අධිකාරීන් ලෙස ක්‍රියා කරයි.

### 3.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන බදු වර්ගයන් පරිපාලනය කරනු ලබයි.

- ආදායම් බද්ද (IT)
- එකතු කල අගය මත බද්ද (VAT)
- ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)
- ආර්ථික සේවා ගාස්තු (ESC)

- 2006 අංක 12 දරණ මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ මුද්දර බද්ද
- ණය ආපසු ගෙවීමේ අය බද්ද (DRL)

### 3.2 පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

පළාත් ආදායම් දෙපාර්තමේන්තු විසින් ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන බදු වර්ගයන් පරිපාලනය කරනු ලබයි.

- 1982 අංක 43 දරණ මුද්දර බදු පනත යටතේ මුද්දර බද්ද
- ඔට්ටු ඇල්ලීමේ බදු (Betting tax)
- ත්‍යාග තරඟ බදු (Prize competition tax)
- ලොතරැයි බදු (Lottery tax)
- ඛනිජ බදු (Mineral tax)
- ඖෂධ හා රසායන ද්‍රව්‍ය බදු (Drug and chemical tax)

### 3.3 රේගු දෙපාර්තමේන්තුව

ආයාත සහ නිර්යාත මත බදු එකතු කිරීමේ වගකීම සහ එම බදු පරිපාලනය කිරීම ද ආනයන සහ අපනයන අධීක්ෂණය කිරීම ද රේගු දෙපාර්තමේන්තුවට පවරා ඇත.

### 3.4 සුරාබදු දෙපාර්තමේන්තුව

දුම්කොළ සහ මත්පැන් මත අදාළ වන සුරා බදු පරිපාලනය කිරීම ද වස, කංසා සහ අන්තරායකර ඖෂධ පිළිබඳ ආඥා පනත ක්‍රියාවට නැංවීම ද සුරාබදු දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

## Q ප්‍රශ්නය

3. ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු අධිකාරීන් 4 ක් සඳහන් කරන්න.

## A පිළිතුර

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
- රේගු දෙපාර්තමේන්තුව
- සුරාබදු දෙපාර්තමේන්තුව

## 4. නීතිමය රාමුව

AAT විෂය නිර්දේශය තුළින් ආවරණය වන විවිධ වූ බදු වර්ග ඒ ඒ අරමුණ සඳහා එකිනෙකට වෙනස් නීතින් යටතේ පනවා ඇති බදු වර්ග වේ. එබැවින් ශ්‍රී ලංකාවේ බදුකරණය හැදෑරීමේදී එකිනෙකට වෙනස් වූ බදු වර්ග කුමන නීතින් යටතේ පාලනය කරනු ලබයි ද යන්න පිළිබඳ අවබෝධය ලබාගත යුතු වේ.

මෙම සියලු ප්‍රධාන පනත් පසුව සංශෝධිත පනත් මගින් සංශෝධනය වන අතරම අදාළ පනතෙන් දී ඇති බලය අනුව, එම පනත් යටතේ නිකුත් කළ ගැසට් නිවේදන ද අදාළ පනතේ කොටසක් ලෙස සැලකේ.

එම නීති අර්ථකථනය කිරීම අධිකරණය වෙත පැවරී ඇති නිසා කලින් තීරණය වූ නඩු තීන්දු (නඩු තීරණ නීතිය) ද නීතිමය රාමුවෙහි කොටසක් බවට පත් වේ.

ඊට අමතරව නීතිය ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සඳහා බදු අධිකාරීන් විසින් නියමයන් නිකුත් කරනු ලබයි. නියමයක් නීතියක් නොවන බවත් නමුත් එය අදාළ බදු අධිකාරිය විසින් යම් සමාන ගැටළුවක් හෝ තත්ත්වයක් සඳහා ගත් තීරණය/පිළිගත් ක්‍රමය වේ.

තවදුරටත්, බදු අධිකාරීන් විසින් පලකරනු ලබන පුවත්පත් දැන්වීම්ද පොදු භාවිතයක් බවට වර්තමානයේ පත් වී ඇත. කෙසේ වුවත්, එම පුවත්පත් දැන්වීම් නීතිමය රාමුවෙහි කොටසක් ලෙස පෙනුන ද අදාළ නීතිය මඟින් ප්‍රතිපාදන සලසා නොමැතිනම්, එම දැන්වීම් නීතිමය රාමුවෙහි කොටසක් නොවන බව සිහි තබා ගත යුතු වේ.

### 4.1 ආදායම් බද්ද

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ මෙම පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදන මඟින් ආදායම් බද්ද පාලනය වේ. මෙම පනත 2018 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

### 4.2 එකතු කළ අගය මත බද්ද

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත, පසුව වූ සංශෝධනයන් සහ පනත යටතේ ගැසට් නිවේදනයන් මගින් එකතු කළ අගය මත බද්ද පාලනය වේ.

### 4.3 ජාතිය ගොඩනැගිමේ බද්ද

2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත හා පසු සංශෝධනයන් මගින් ජාතිය ගොඩනැගීමේ බද්ද පාලනය වේ.

### 4.4 ආර්ථික සේවා ගාස්තු

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත, එහි පසු සංශෝධනයන් සහ පනත යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයන් යටතේ ආර්ථික සේවා ගාස්තු පාලනය වේ.

### 4.5 මුද්දර ගාස්තු

2006 අංක 12 දරණ මුද්දර ගාස්තු පනත, එහි පසු සංශෝධනයන් සහ පනත යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයන් මගින් මුද්දර ගාස්තු පාලනය වේ.

## 5. ආදායම් බද්ද පැනවීම

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 2 වන වගන්තිය මඟින්, බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තකු හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තකු මත බදු වගකීම පනවයි.

දේශීය ආදායම් පනතේ 2 වන වගන්තියේ සාරාංශය පහත පරිදි දැක්විය හැක.

**ගෙවීමට යටත් වන්නේ කවරකුද?**

අදාළ වර්ෂය සඳහා බදු අයවන ආදායමක් ඇති තැනැත්තා

**බදු අයවන ආදායම යනු කුමක්ද?**

තැනැත්තකුගේ රැකියාව/වෘත්තිය, ව්‍යාපාරය, ආයෝජන සහ අනෙකුත් ආදායම් මාර්ගවලින් සුදුසුකම්ලත් ගෙවීම් හා සහන අඩු කළ විට ලැබෙන මුළු තක්සේරු ආදායම

↓

**බදු ගණනය කළ යුත්තේ කෙසේ ද?**

එම තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායමට පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් අදාළ ආදායම් බදු අනුප්‍රමාණ අදාළ කර ගැනීම මගින්

අඩුකළා

පනතේ 80 වන වගන්තිය යටතේ අදාළ වර්ෂය සඳහා එම තැනැත්තා විසින් හිමිකම් පා ඇති සහ ඉඩ දෙනු ලැබ ඇති විදේශීය බදු බැර

මේ පනත යටතේ අදාළ වර්ෂය සඳහා එම තැනැත්තාට ප්‍රදානය කරන ලද හෝ ඉඩ දෙනු ලැබ ඇති වෙනත් බදු බැර

පනතේ පළමු උපලේඛනයේ විශේෂයෙන් සඳහන් කළ අනුපාත අනුව අවසාන රඳවා ගැනීම ගෙවීම්වලට පුද්ගලයකුගේ ආදායම සීමා වන්නේ නම්, එවැනි ආදායම් බදු ආදායම සඳහා සලකා නොලබන අතර තවදුරටත් බදු සඳහා වග කියනු නොලැබේ.

පහත ප්‍රශ්නවලට පිළිතුරු දේශීය ආදායම් පනතේ 2 වන වගන්තියෙන් සොයා ගත හැක.

- ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ කවරකු ද? (Who)
- ආදායම් බදු ගණනය කළ යුත්තේ කුමන කාල පරාසයකට වරක් ද? (How frequently)
- ආදායම් බදු වගකීම ගණනය කරනුයේ කුමක් මතද? (On what)
- ආදායම් බදු වගකීම කුමන ප්‍රතිශතයක් මත ගණනය කෙරේ ද? (At what rate)

ඉහත කරුණු විස්තරාත්මකව අධ්‍යයනය කිරීම අපට වැදගත් වේ.

## 5.1 ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ කවරකු ද?

**බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තකු හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තකු බදු ගෙවීමට යටත් වේ.**

දේශීය ආදායම් පනතේ 195 වගන්තිය අනුව "තැනැත්තා" යන්න පහත පරිදි නිර්වචනය කර ඇත.

**"තැනැත්තා"** යන්නෙන්, **පුද්ගලයකු හෝ අස්තිත්වයක්** අදහස් වන අතර,

- සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්
- පොල්මඃකරුවෙක්
- රාජ්‍ය නොවන සංවිධානයක්
- පුණ්‍යායතනයක් ඊට ඇතුළත් වේ. (195 වගන්තිය)

"අස්තිත්වය" යන්නෙන්, යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ භාරයක් අදහස් වන නමුත් යම් පුද්ගලයකු ඊට ඇතුළත් නොවේ. (195 වගන්තිය)

ඒ අනුව තැනැත්තා යන්නට,

- පුද්ගලයකු,
- සමාගමක්,
- හවුල් ව්‍යාපාරයක්,
- භාරයක්,
- සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්,
- පොල්මඃකරුවෙක්,
- රාජ්‍ය නොවන සංවිධානයක් සහ
- පුණ්‍යායතනයක් ඇතුළත් වේ.

බදු අය කළ හැකි ආදායම, එම වර්ෂය සඳහා සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් සහ වෙනත් මූලාශ්‍රවලින් වූ තක්සේරු කළ හැකි සම්පූර්ණ ආදායමෙන් සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩු කරනු ලැබීමෙන් පසු අගයට සමාන වේ.

අදාළ අවසාන රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතු ගෙවීම්, අවසාන රඳවා ගැනීමේ ගෙවීම් වේ. ඒ අනුව අදාළ අවසාන රඳවා ගැනීමේ බද්ද අඩු කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවූ පසු, එම ගෙවීම්, තව දුරටත් බද්දට යටත් නොවේ. (88 වගන්තිය)

උදා ඃ

- වාසික සමාගමක් විසින් වාසික තැනැත්තකු වෙත ගෙවන ලද ලාභාංශ
- වාසික පුද්ගලයෙකුහට කරනු ලබන පොලී ගෙවීම් ( දී ඇති සහන සීමාව දක්වා (එනම් රු. මිලියන 1.5ක් දක්වා) ජ්‍යෙෂ්ඨ පුරවැසියකුට ගෙවනු ලබන යම් පොලී ප්‍රමාණයක් හැර)
- පුණ්‍ය ආයතනයක් වෙත ගෙවන ලද පොලිය
- ඔට්ටු ඇල්ලීම හෝ සූදුවලින් සමන්විත ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී ලද මුදල් ප්‍රමාණ හැර, ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදුවලින් දිනුම් ලෙස ගෙවන ලද මුදල් ප්‍රමාණ සහ,
- රඳවා ගැනීමට යටත් වන, නිර්වාසික තැනැත්තන් වෙත කරන ලද ගෙවීම් (ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් හරහා උපයන ලද ගෙවීම් හැර)

## 5.2 ආදායම් බදු ගණනය කළ යුත්තේ කුමන කාල පරාසයකට වරක් ද?

සෑම තක්සේරු වර්ෂයක් (Year of Assessment) සඳහාම ආදායම් බද්ද ගණනය කළ යුතුය. බදු කාලපරිච්ඡේදය තක්සේරු වර්ෂය යනුවෙන් හැඳින්වේ.

**"තක්සේරු වර්ෂය"** යන්නෙන් යම් වර්ෂයක අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භ වී ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලසීමාව අදහස් වේ. (20(1) වගන්තිය)

උදාහරණ ලෙස, 2018/19 තක්සේරු වර්ෂය 2018 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා කාලසීමාව ආවරණය වේ. නමුත්, භාරයක් හෝ සමාගමක් එහි තක්සේරු වර්ෂය වෙනස් කිරීම සඳහා ආදායම් බදු කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටිය හැකිය. [(20 (2) වගන්තිය]

## 5.3 කුමක් මත ආදායම් බද්ද ගණනය කළ යුතු ද?

යම් තැනැත්තෙකුගේ, වර්ෂය සඳහා සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් සහ වෙනත් මූලාශ්‍රවලින් වූ මුළු තක්සේරු කළ හැකි ආදායම මත ආදායම් බද්ද ගෙවිය යුතුය.

යම් තක්සේරු වර්ෂයක බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී, එම වර්ෂය සඳහා 52 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩු කරනු ලැබිය යුතුය.

එක් එක් තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායම සහ එක් එක් මූලාශ්‍රයෙන් තක්සේරු කළ හැකි ආදායම වෙන් වෙන්ව නිශ්චය කළ යුතු ය.

## 5.4 ආදායම් බදු ගණනය කළ යුත්තේ කුමන ප්‍රතිශතයක් මත ද?

ආදායම් බදු සඳහා යටත් තැනැත්තන්, දේශීය ආදායම් පනතේ පළමු වන උපලේඛනයන්හි දක්වා ඇති බදු ප්‍රතිශතයන් යටතේ බදු ගෙවිය යුතුය.

## Q ප්‍රශ්නය 04

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 2 වගන්තිය (බද්ද අය කිරීමේ විධිවිධානය) ප්‍රකාරව ආදායම් බදු සම්බන්ධව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කවරකු විසින්ද?

ii. කුමන කාල පරාසයකට වරක්ද?

iii. කුමක් මත ද?

iv. කුමන ප්‍රතිශතයක් මත ද?

## A පිළිතුර 04

i. කවරකු විසින්ද? - බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තකු හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තකු

ii. කුමන කාල පරාසයකට වරක්ද? - සෑම තක්සේරු වර්ෂයක් සඳහා

iii. කුමක් මත ද? - සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් සහ වෙනත් මූලාශ්‍රවලින් වූ තක්සේරු කළ හැකි සම්පූර්ණ ආදායමෙන් සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩු කරනු ලැබීමෙන් පසු අගය මත

iv. කුමන ප්‍රතිශතයක් මත ද? - පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් අනුපාත යටතේ

# 6. වාසික නීතිය (69 වගන්තිය)

බදු අරමුණු සඳහා, තැනැත්තන් වාසික තැනැත්තන් හෝ නිර්වාසික තැනැත්තන් ලෙස වර්ගීකරණය කළ යුතුවේ. බදු අරමුණු සඳහා වාසිකභාවය, සාමාන්‍ය වාසිකභාවය යන අදහසින් වෙනස් වේ.

වාසික තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, මූලාශ්‍රය කවර ස්ථානයකින් පැන නැගුණ ද, එම තක්සේරු වර්ෂයේ සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් සහ වෙනත් මූලාශ්‍රවලින් එම තැනැත්තාට ලැබෙන ආදායම මත එනම් ගෝලීය ආදායම මත බදු ගෙවිය යුතුවේ.

නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයකින් උද්ගත වන තාක් දුරට නැතහොත් උපයන තාක් දුරට සේවා නියුක්තියෙන්, ව්‍යාපාරයෙන්, ආයෝජනයෙන් හෝ වෙනත් මූලාශ්‍රයකින් එම තැනැත්තාට ලැබෙන ආදායම මත බදු ගෙවිය යුතුවේ.

මේ තත්වය යටතේ යම් තක්සේරු වර්ෂයක ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා වාසික හෝ නිර්වාසික බව තීරණය කිරීමේ ක්‍රමවේදය අවබෝධ කරගැනීම වැදගත් වේ. වාසිකභාවය තීරණය කිරීමේදී රීතීන් කිහිපයක් භාවිතා වේ.

## 6.1 පුද්ගලයන්ට අදාළ වාසික නීතිය

කායික වශයෙන් ශ්‍රී ලංකාව තුළ සිටි දින ගණන පදනම් කරගෙන යම් පුද්ගලයකුගේ ශ්‍රී ලංකාවේ වාසික බව නිර්ණය කෙරේ.

**වාසික නීතිය**

යම් පුද්ගලයකු යම් තක්සේරු වර්ෂයක් සඳහා -

- ශ්‍රී ලංකාව තුළ වාසය කරයි නම්,
- එම වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ එම කායිකව සිටීමේ කාලසීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුළ දී දින එකසිය අසූතුන (183)ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්
- එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයකු හෝ නිලධරයකු වේ නම් සහ එම පුද්ගලයාගේ කලත්‍රයා එම වර්ෂය තුළ විදේශයක ඇත්නම්
- වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව, ශ්‍රී ලංකා නෞකාවක සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඔහු එසේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුළ,

එම තක්සේරු වර්ෂය පුරාම ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා වාසික පුද්ගලයකු සේ සැලකේ.

## බදුකරණය සඳහා නේවාසික බව නිර්ණය කිරීම

පිලිප් මහතා සිංගප්පූරුවේ පුරවැසියෙකි. ඔහු බහුජාතික සමාගමය ආනයන සැපයුම් කළමනාකරු ලෙස සේවය කරයි. පිලිප් මහතා අවස්ථා කිහිපයකදීම ශ්‍රී ලංකාවේ මෙහෙයුම් පිළිබඳ සොයා බැලීමට ලංකාවට පැමිණ ඇති අතර එම තොරතුරු පහත දැක්වේ.

| පිටවීම | පැමිණීම | ශ්‍රී ලංකාවෙන් පිටත |
|---|---|---|
| 03.04.2018 | 21.05.2018 | 48 |
| 04.06.2018 | 30.07.2018 | 56 |
| 15.09.2018 | 14.11.2018 | 60 |
| 01.12.2018 | 22.12.2018 | 21 |
| එකතුව | | 185 |

ඉහත තොරතුරු අනුව, 2018/19 තක්සේරු වර්ෂය තුළ ශ්‍රී ලංකාව තුළ දින 185ක් කායික වශයෙන් ගත කර ඇති නිසා බදු අරමුණු සඳහා සිල්වා මහතා වාසික පුද්ගලයෙක් සේ සැලකේ.

## 6.2 අනෙකුත් අස්තිත්වයන්ට අදාළ වන වාසික නීතිය (69 වගන්තිය)

**යම් හවුල් ව්‍යාපාරයක් -**

- ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද්දේ නම් හෝ
- යම් තක්සේරු වර්ෂයක් තුළ යම් අවස්ථාවක දී එම හවුල් ව්‍යාපාරයේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත්නම්,

එම හවුල් ව්‍යාපාරය එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයකු වේ.

**යම් භාරයක් -**

- එය ශ්‍රී ලංකාව තුළ පිහිටු වූයේ නම්,
- තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක එම භාරයේ භාරකරු ශ්‍රී ලංකාව තුළ වාසිකව සිටියේ නම් හෝ
- තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තකු තනිව හෝ වෙනත් තැනැත්තන් සමඟ එක්ව නැතහොත් ඍජුව ම හෝ එක් අස්ථිත්වයක් හෝ එකකට වැඩි අතරමැදි අස්ථිත්වයන් මගින් හෝ වුව එම භාරයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තීරණ මෙහෙයවන්නේ නම් හෝ මෙහෙයවිය හැකි නම්,

එම භාරය එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයකු වේ.

**යම් සමාගමක් -**

- ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කර හෝ පිහිටුවා ඇත් නම්,
- එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත්නම් හෝ
- තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක දී එම සමාගමේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත්නම්,

එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයකු වේ.

## Q ප්‍රශ්නය

5. වාසික නීතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

6. ශ්‍රී ලංකාව තුළ රැකියාවක නියුක්ත සහ වරින් වර විදේශ ගත වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන පුද්ගලයකුට බලපාන වාසික නීතිය පැහැදිලි කරන්න.

7. සමාගමක වාසික භාවය තීරණය කිරීමට බලපාන නීතිය සඳහන් කරන්න.

## A පිළිතුර

5. ''නේවාසික'' යන්න කුමක් ද යන්න ආදායම් පනතේ නිර්වචනය කර නොමැත. එමනිසා, පොදු අර්ථකථනය සලකා බැලිය යුතුය.

   - ශ්‍රී ලංකාව තුළ ස්ථිර නිවසක් තිබීම

   - තැනැත්තාගේ කුටුම්භය ලංකාවේ ජීවත් වීම

   යන කරුණු මත ශ්‍රී ලාංකික පුරවැසියෙක් ලෙස හැඳින්වේ.

6. යම් තක්සේරු වර්ෂයක් තුළ දී ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ එම කායිකව සිටීමේ කාලසීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුළ දී දින එකසිය අසූතුන (183)ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්, එම පුද්ගලයා එම තක්සේරු වර්ෂය පුරා වාසික සේ සැලකේ.

7. - ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කර හෝ පිහිටුවා ඇත් නම්,
   - එහි ලියාපදිංචි හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත්නම් හෝ
   - තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක දී එම සමාගමේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත්නම්,

එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වේ.

# සාරාංශය

**බදුකරණය හැඳින්වීම**

- බදුකරණයේ කාර්යයන් (රාජ්‍ය වියදම් සඳහා අරමුදල් රැස් කිරීම, සාමාජීය කාර්යයන්, ආර්ථිකමය කාර්යයන්)
- බදුකරණයේ මූලධර්ම (සාධාරණත්වය, වර්ධක බව, රැස්කිරීමේ පිරිවැය අවම වීම, නිශ්චිත බව, ප්‍රමාණවත් බව, සරළ වීම, පුළුල් පරාසයක් වීම, ස්ථාවරත්වය, ස්වේච්ඡා අනුකූලතාවය)

**සෘජු සහ වක්‍ර බදු**

- බදු ගෙවන්නා විසින් සෘජු බදු දැරීම
- බදු ගෙවන්නා විසින් වෙනත් දරන්නෙකු වෙත පවරනු ලබන වක්‍ර බදු

**බදු අධිකාරීන්**

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව

**නීතිමය රාමුව**

- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත, 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත, 2009 අංක 9 දරණ ජාතිය ගොඩ නැගීමේ බදු පනත, 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත, 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු( විශේෂ විධිවිධාන ) පනත සහ සංශෝධිත පනත්

**අදායම් බද්ද පැනවීම**

යම් තක්සේරු වර්ෂයක ඕනෑම තැනැත්තකුට ඇතිවන ලාභ සහ ආදායම් මත පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ යටතේ ආදායම් බද්ද පැනවීම කරනු ලබයි.

**වාසික නීතිය**

යම් තක්සේරු වර්ෂය තුළ දින 183 ක් හෝ ඊට වැඩි ගණනක් ශ්‍රී ලංකාව තුළ කායික වශයෙන් පෙනී සිටි පුද්ගලයෙක් වාසික පුද්ගලයකු වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාව තුළ පිහිටා තිබීම හෝ සමාගමේ පරිපාලන කටයුතු හෝ කළමණාකරණ කටයුතු ශ්‍රී ලංකාව තුළ සිදු වේ නම් වාසික සමාගමකි.

## අභ්‍යාස

1. සෘජු හා වක්‍ර බදු සැසඳීමේදී වඩාත් පහසුවෙන් සහ ඵලදායී ලෙස එකතු කරගත හැක්කේ කුමන බදු වර්ගයද?

2. බදු ගෙවන්නෙකුට වෙනස් කාලපරිච්ඡේදයක තක්සේරු වර්ෂයක් සඳහා ඉල්ලුම් කළ හැකි ද? එක් එක් අවුරුද්දක මාර්තු 31 සහ ඊට පසු වර්ෂය දෙසැම්බර් 31 ලෙස දේශීය ආදායම් පනත අනුව එය කළ හැකිද, එසේ නම් කළ හැකි ආකාරය සඳහන් කරන්න.

3. විදේශ ලියාපදිංචි සමාගමක්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ "විදේශ සමාගමක්" ලෙස ලියාපදිංචි කිරීමට අවසර ඇති බැවින්, ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සැලකිල්ලට ගත හැකිද යන්න සඳහන් කරන්න.

## විසඳුම්

1. වක්‍ර බදුවලදී බදු ගෙවන්නා විසින් බදු බර දැරීමක් සිදු නොවන නිසා වඩාත් පහසුවෙන් වක්‍ර බදු එකතුකර ගත හැකි වේ.

2. පුළුවනි. වලංගු සාධාරණ හේතු සඳහන් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කලින් කරන ලද ලිඛිත අවසරයක් සහිතව වෙනස් කාලපරිච්ඡේදයක තක්සේරු වර්ෂයක් ආවරණය කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට භාරයකට හෝ සමාගමකට හැකියාව ඇත. අනුමැතිය සමග අරමුණා ඇති නියමයන් හෝ කොන්දේසි සමග එකඟ නොවේ නම් එම අනුමැතිය ආදායම් කොමසාරිස්වරයාට නැවත වැළැක්විය හැකිය.

3. පුළුවනි."විදේශ සමාගමක්" ලෙස ලියාපදිංචි සමාගමක්ද 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූලව ලියාපදිංචි සමාගමක් වන අතර එහි මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකාව තුළ කරගෙන යන බැවින් ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සැලකේ.